# බැංකුවලට මේ මොකද වෙන්නෙ?

**ලෝ**ව නමගිය බැංකු සමාගම් ප්‍රධාන ලෝක ආර්ථික පද්ධතිය අද කරකවා අත හැරිය බඹරයක් ලෙස අන්දුන් කුන්දුන් වී දහලයි. දැන් ටෙලිවිෂන් පුවත්පත් හා ප්‍රවෘත්ති ප්‍රධාන වශයෙන් නිරතුරු පෙන්වන්නේ මෙතෙක් නොසැලෙන ගල් පර්වත වාගේ තිබුණු නමගිය බැංකු පවා එකෙන් එක කඩාවැටෙන ආකාරයයි. ටික කලෙක සිට ක්‍රමයෙන් මේරූ මෙය සති කීපයකට පෙර තීව්‍ර වී දැන් ඇමරිකාව ප්‍රමුඛ මුළු ධනවාදී ආර්ථික පද්ධතියම උණුවීම කට භාජනය වී තිබේ. එහි ප්‍රථිපලය ලෙස මුළු ආර්ථිකයම හිරවී ඇත. එය තුල මුදල්වල සුමට ගැලීම වැලකී තිබේ. හරියටම තෙල් වියලී ගිය යන්ත්‍රයක් හිරවී නතරවීම වැනිය. එය නැවත දුවන්නට එන්ජින් ඔයිල් දැමිය යුතුවා සේම මේ යන්ත්‍රයටද මහා පරිමාණයෙන් මුදල් පොම්ප කළ යුතුය. එසේ සිදු නොවුව හොත් මුළු ආර්ථිකයම වැටේ. එවිට ජනතාවගේ ජීවනෝපාය හිරවී අර්බුදයක් බවට පත්වන ලකුණු දැන් දැන් පෙනේ. මේ සිදුවන්නේ කුමක්ද? කුමක් නිසාද? යන්න ගැන සරල විමසුමකි මේ.




**The Plucked Bald Eagle - National Emblem of the George Bush Administration.** ඇමරිකානු රාජ්‍ය ලාංඡනය පියාපත් විහිදාගෙන සිටින උකුස්සාය. එහෙත් දැන් උකුස්සාගේ පිහාටු ගැලවී හැලී ඌ මුළුමනින් නිරුවත් ව සිටී. මේ අද බැංකු ඇද වැටී දැවැන්ත මුදල් අර්බුදයකට මුහුණ පා සිටින ඇමරිකාවේ සැබෑ ආර්ථික ස්වභාවය දක්වමින් ඇමරිකානු සඟරාවල පළවූ සිය ගණනක් කාටූන් වලින් එකකි.

## මෙහි මූල

බ්‍රිතාන්‍යයේ ටික කලකට පෙර මහත් ආන්දෝලනයක් ඇති කළ නෝදන් රොක් Northern Rock බැංකුවේ වැටීම මෙය මෙහි දැනුණු ප්‍රථම අවස්ථාවයි. මේ සිදු වූයේ තෙල් මිළ පහත වැටීමත් සමගය. ආයෝජන බැංකුවක් Investment Bank වූ මෙය නිවාස මිළට ගැන්මට දිගට හරහට ණය දුණි. නිවාස වෙළඳ පොළ වැටීමත් සමග උගස් ණය mortgage වාරික යන් ආපසු අයවීම් හිරවීමත් සමග එම බැංකුව අර්බුදයට පත්විය. හේතුව වූයේ එම බැංකුව එම ණය දුන්නේ කාලයක තැන්පත් ධනයක් පදනම්කොටගත් ශක්තියක් මත නොව hedge funds නමින් හැඳින්වූ සමපේක්ෂිත speculative අර මුදල් මත බැවිනි. උගසට තැබූ ගෙවල් වල වටිනාකමද බැසීම නිසා මෙම තත්වය තවත් උග්‍රවිය. හරියටම නොවටිනා දෙයක් උගසට ගෙන ණය දුන්නාක් වැනිය. අන්තිමේදී හිරවුණු **නෝදන් රොක් බැංකුව** ගොඩ ඇදීමට බ්‍රිතාන්‍ය රජයට මැදිහත්වීමට සිදුවිය. අවසන් වූයේ රජය එම බැංකුව රජසතු කරගැනීමෙනි. මේ සඳහා පවුම් මිලියන සිය ගණනක් ගියේ භාණ්ඩාගාරයේ මුදල් ය. ඒ කියන්නේ එයට ගෙවන්නේ රටේ බදුගෙවන ජනතාවය. මේ අයුරින්ම ණය දුන් Bradford & Bingley බැංකුවද රජයට ගන්නට සිදුවිය. මේ දේ ඇමරිකාවේ මෙයට වඩා සිය ගණනින් විශාල පරිමාණයෙන් සිදුවිය. එම බැංකු ගොඩ ඇදීමට ඇමරිකානු රජයට මුදල් මිලියන් නොව බිලියන් සියගණනින් ගෙවන්නට සිදුව ඇත.

## බැංකු මංකොල්ලය

කාලයක් තිස්සේ තැන්පත් මුදල්, ධන සම්පත් ආදිය පදනම් කොටගෙන ගොඩනැගුණු පැරණි බැංකු ණය දෙනවිට වුවද ඒවාට එසේ ස්ථාවරබව සපයන තැන්පත් ධනසම්භාරයන්ට අනුපාතිකව ණය දෙති. ඒ නිසා එවැනි බැංකු මෙසේ ණය ආපසු නොගෙවීම්, පැහැරහැරීම් ආදියෙන් විපතට පත්වුණේ නැත. එහෙත් මෑතක ඇරඹූ බැංකු ඉහතින් දැක් වූ speculative funds මත වැඩි වැඩියෙන් ණය දුන් විට උගසට තබාගත් නිවාස ඉඩකඩම් ව්‍යාපාර ආදියේ වටිනාකම් වෙළඳපල වෙනස්වීම නිසා වැටෙනවාත් සමග පහසුවෙන්ම ගරාවැටුණේය.

විශේෂයෙන් පෙර පැවති නිවාස ණය සමිති (Building Societies) මාග්‍රට් තැචර්ගේ කාලයේ බැංකු ලෙස ඉහළ දැමීම අරඹා තිබුණි. මේ කඩාවැටුණු සමහර බැංකු එවැනි බැංකුය. ඒවා අනුමාන ගණුදෙනුවලට හොඳ වූ නමුත් මහා පරිමාණ ණය ගනුදෙනුවලට බැසීම අර්බුදයට ප්‍රධාන හේතුව ය.

අනෙක මේ බැංකු උපයා ගන්නා ලාභ පළමුව ඒවායේ කොටස්කරුවන් පිනවීමට විශාල ලාභ කොටස් ගෙවති. ඊට අමතරව එම ලාබවලින් ඒවායේ අධ්‍යක්ෂක මණ්ඩලයට ඇතුළු ඉහළ මට්ටමේ නිලධාරීන්ට මිලියන පියල්ලෙන් වැටුප් හා බෝනස් ගෙවති. මේවාට රජයේ සහ පාලක පෙලැන්තියේද අනුග්‍රහය ලැබේ. මේ දෙගොල්ලම එකම පන්තියේ බැවිනි. බැංකු ඇතුළේ දරිද්‍ය අදිමින් එම ධන නිෂ්පාදනයට උපකාරීවන බැංකු ලිපිකරුවන්, තාක්ෂණික කාර්මික යන් සුළු වශයෙන් හෝ පඩි වැඩිවීමක් ඉල්ලූ විට එය ආර්ථික යට අහිතකරව බලපාන ආකාරය ගැන නන්දොඩවන ඔවුන් සහ ධන වාදී මාධ්‍යය මේ බැංකු මංකොල්ලයන්ට ඇස පියාගෙන සිටිති.

මේ බැංකු පාලකයෝ සහ කොටස්කරුවෝ මිලියන බැඳි පියල්ලෙන් බඩජාරී ලෙස බැංකු මංකොල්ල කා ඒවා කඩාවැටෙන විට හෙමින්ම මාරුවෙති. එම පාඩුවීම්වලට වගකීමටවත් ඔවුන් බැඳී නැත. මේ සියල්ලටම වන්දි ගෙවන්නේ ඒවායේ වැඩකරන අයගේ රැකියාව අහිමි වී මහපාරට බහින්නට සිදුවීමෙනි. ළඟදී බංකොලොත්වූ ලීමන් සහෝදර බැංකුවේ (Lehman Brothers) සේවක පිරිස් 25000 කට එසේ රැකියාව අහිමිවී පාරට බසින් නට සිදුවිය. බ්‍රිතාන්‍යයේද ගනුදෙනු වලින් 1/5 තිබුණු එම බැංකුවේ 5000 ක් ලන්ඩන් ඇතුළු ප්‍රධාන නගර කීපයකම සේවකයන්ට රැකියා අහිමිවීය.

ආර්ථිකය බිඳ වැටීම වැළැක්වීමටයයි කියමින් මෙසේ වැටෙන බැංකු ගොඩ ඇදීමට පාලකයෝ රජයේ භාණ්ඩාගාරයෙන් මුදල් ආයෝජනය කරති. එවිට එම බරට කරගහන්නේ ද රටේ ජනතාවය. උදාහරණයක් වශයෙන් දැන් ඇමරිකන් බැංකු ආර්ථිය ගොඩ ඇදීමට යෝජිත බිලියන 700 යේ අරමුදල ඇමරිකානු ජනයා අතර බෙදුණු විට මුළු ජනගහනය බාල මහළු සියළු දෙනා එක් අයෙකු ඩොලර් 2000 බැගින් වන්දි ගෙවනු ඇත. මෙහිදී සඳහන් කළයුතු වැදගත්ම කරුණ නම් ලොවට, විශේෂයෙන් ශ්‍රීලංකාව වැනි රටවලට ආර්ථික නීති රීති පණවන ලෝක බැංකුව සහ **IMF** දෙක දැන් කොහේද කියාවත් නැතිවීමය. උන්ට මේවාට උත්තරත් නැත. මක්නිසාද උන් දෙගොල්ලන්ද මේ මංකොල්ලයේ කොටස්කරුවන් බැවිනි.

මේවා ගැන ධනවාදී දේශපාලකයින්ද මාධ්‍යයද කතාකරන්නේ ලෝකයාට විටින්විට මුහුණදීමට සිදුවන සුනාමි, භූමිකම්පා, ජලගැලීම් වැනි ස්වාභාවික සිදුවීම් ආකාරයෙනි. එහෙත් මේවා ස්වාභාවික සිදුවීම් නොව ධනවාදී ආර්ථික රටාවේ නිදන්ගතව ඇති බඩජාරී කම (greedy) නිසා බව පළමුවෙන්ම පෙන්වා දෙනු ලැබූයේ 1800 ගණන්වල අගභාගයේදී කාර්ල් මාක්ස් විසිනි. ඔහු කියූ දේ පසුගිය ශතවර්ෂ 1½ තුළ වාර කීපයක්ම ධනවාදී ලොව තුළ සිදුවිය. 1930 ධනවාදී ලෝකය විශාල ආර්ථික අර්බුදයකට මුහුණ දීමද දෙවන ලෝක යුද්ධයට තුඩු දුන් ආකාරය පසුගිය දිනවල විවාද වලදී මෙහි සහ ඇමරිකාවේ කියැවිණ. අද ලොව එකම අන්තර් ජාලයකට සම්බන්ධවී ඇති වෙළඳ පොළ බැංකු සහ ආර්ථික ක්‍රමයන් යටතේ මෙම අර්බුදයන් වඩ වඩා වේග යෙන් ළං ළංව ලොව පැතිර යමින් ලොවම ගිලගන්නා සෙයක් පෙනේ. 1987 අර්බුද යක් සිදුවිය. දැන් නැවත අර්බුදයකි. මේවා හොඳ උදාහරණ වෙති. ලංකාව වැනි ආසියාකරයේ රටවල ටද මෙය ඉක්මනින් හෝ ප්‍රමාදවී හෝ බලපානවා නිසැකය. මේ ලිපිය මා විශේෂයෙන් ලියුවේ අප රටේ ආර්ථිකය හසුරුවන අයගේ දැනගැන්ම පිණිසය.

♦ ***වකුල ගුණපාල***
**Ilford, Essex UK**

# සම්මානනීය සේවාවක් ඉටුකර ප්‍රංශයෙන් සමුගෙන ගිය ලංකා තානාපතිනිය





**නී**දි කිරා වැටෙන තත්වයක පැවති තානාපති කාර්‍යාලයකට පත්ව ආ විත්‍රාංගනී වාගීශ්වර තානාපතිතුමිය නිසා ප්‍රංශයේ ශ්‍රීලංකා තානාපති කාර්‍යාලය නව පිබිදීමක් ලැබුවාය යන්න ප්‍රංශයේ වසන ශ්‍රීලාංකිකයෝ අවිවාදයෙන්ම පිලිගනිති. ප්‍රංශයේ වැඩවසන මහාසගහරුවනත්, ශ්‍රීලාංකික සංවිධානත් ඒකාත්මික කරන්නටත්, අප මාතෘභූමියේ භෞමික අඛණ්ඩතාව රැකගැනීම පිණිසත්, ප්‍රංශයේ දෙමළ ත්‍රස්තවාදී සංවිධාන සහ පැරිසියේ පිහිටුවා ඇති ඔවුන්ගේ මාධ්‍ය ජාලය මුළුමනින්නම අඩාල කරන්නටත්, යුරෝපීය බලධාරීන් ලවා ඊට තහංචි පැනවීමට බලකරවන්නටත්, නිදහස් දිනය හැමගේ දිනයක් කරන්නටත්, මේ ආදී වශයෙන් අප තානාපතිතුමිය සැබැවින්ම ඉමහත් කාර්‍යභාරයක් ඉටු කළා ය.

වසර තුනක් වූ සිය සේවා කාලය අප මවුබිමට සේවාවක් සඳහාම කැප කොට මව්බිම බලා පිටත්ව යාමට කලින් ප්‍රංශයේ සියලු ලාංකික සංවිධාන වෙනුවෙන් තානාපති නිල නිවහනෙහි පැවති භෝජන සංග්‍රහයේ දී ප්‍රංශයේ ශ්‍රීලංකා සිංහල සංස්කෘතික සංවිධානය වෙනුවෙන් එහි සභාපති අජිත් රණසිංහ මහතා වාගීශ්වර තානාපතිතුමියට තිළිනයක් පිරිනැමූ අතර, ප්‍රංශයේ ශ්‍රීලාංකිකයින්ගේ සංවිධානය වෙනුවෙන් එහි නියාමක රන්ජන් බණ්ඩාර මහතා රුපියල් ලක්ෂ දහයක චෙක්පතක් අප දේශය සුරැකීමේ යෙදී සිටින වීරෝදාර රණවිරුවන්ගේ ශුභසාධනය සඳහා යෙදවීමට ආරක්ෂක අමාත්‍යංශයට බාරදීම සඳහා තානාපතිතුමියට පිරිනැමුවාය. එසේම එදින රැස්වූ මහා සංඝරත්නය ආශීර්වාදාත්මක පූජාවක් පවත්වා චිත්‍රාංගනී වාගීශ්වර තානාපතිතුමියට දේශාභිමානී සම්මානය පිරිනැමීමද සිදුවිය.

♦ **අමර ගුණසේකර Paris - France**

